museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2022 දෙසැම්බර්

**ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයේ 'මුණගැසීම්' සඳහා සහයෝගය දැක්වීමට යුරෝපා සංගමය හවුල්වේ.**

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරයෙහි (MMCA ශ්‍රී ලංකා) 2022 පෙබරවාරි 11 දින 'මුණගැසීම්' නමින් විවෘතවූ දෙවන ප්‍රදර්ශනයෙහි හවුල්කරුවෙකු ලෙසින් යුරෝපා සංගමය (EU) 2022 පෙබරවාරි මස සම්බන්ධවිය.

"EU විසින් 'මුණගැසීම්' සඳහා ලබාදුන් සහයෝගය MMCA ශ්‍රී ලංකාහට සයමාසික මහජන වැඩසටහන් නොමිලයේ ඉදිරිපත් කිරීමට ඉඩ සැලසුවා" යැයි MMCA ශ්‍රී ලංකාහී ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරා EU විසින් 'මුණගැසීම්' සඳහා ලබාදුන් සහයෝගට කෘතඥතාවය පළකළා ය. "මෙම වැඩසටහන් බොහෝමයක් ඉදිරිපත්කරනු ලැබුවේ, රටේ ආර්ථික සහ දේශපාලනික තත්ත්වය විසින් ඇතිකළ දැඩි දුෂ්කරතාවලට දිවයින පුරා ජනතාව විරෝධය දැක්වූ අරගල සමයේදී" යැයි ඇය තවදුරටත් කීවා ය. රටේ දුෂ්කරතා තිබියදී පවා, MMCA ශ්‍රී ලංකා අඛණ්ඩව නරඹන්නන් ආකර්ෂණයකරගත්තේ ය. ප්‍රේක්ෂක සහභාගීත්වය පිළිබඳ අදහස් දක්වමින් පෙරේයිරා සඳහන්කරන්නේ, "මෙම කාලය තුළ ප්‍රහේලිකා දවස් සහ සාකච්ඡා මූලික වැඩසටහන් වැනි කණ්ඩායම් වැඩසටහන් සඳහා සහභාගීවූවන්ගේ ප්‍රමාණය අපේක්ෂා කළ ප්‍රමාණයට වඩා ඉහළයි. මෙයින් පෙන්වාදෙන්නේ අපගේ වැනි කෞතුකාගාර මහජන සහභාගීත්වය සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සහ අප සිටිනා සමාජ වෙත අපගේ දොරටු විවරකිරීම ඉතා සවිඥානිකව සිදුකිරීම කෙතරම් අතයවශ්‍ය ද යන්නයි."

EU මෙම ආධාරය හරහා 1,087 සහභාගීවුණු නොමිලේ පැවැත්වුණු මහජන වැඩසටහන් 61 සඳහා නිර්ලෝභීව දායකවිය. මෙයට ප්‍රායෝගික අත්දැකීම් තුළින් ප්‍රදර්ශනයෙහි තබා ඇති කලාකෘති සමග සහභාගීවන්නන් සම්බන්ධකළ වැඩමුළු 11 ඇතුළත්විය. "ප්‍රදර්ශනයට අදාළ තේමා සමග සකස්කර ඇති මෙම වැඩමුළු, මුද්දර වලින් ඉතිහාසය කියවීමේ සිට, කතන්දර කීම, උද්භිද චිත්‍ර ඇඳීම, දෘශ්‍ය සටහන්කරණය, මැහුම් හා එම්බ්‍රොයිඩරි කලාව, ඔරිගාමි, සහ පරිසර හිතකාමී දිවියක් ගෙවීම දක්වා පරාසයක දිවෙන විවිධ රුචිකත්වයන්හි නියැලීමට සහභාගීවන්නන්ට ඉඩ ලබාදී ඇතැයි" MMCA ශ්‍රී ලංකාහී අධ්‍යාපන හා මහජන වැඩසටහන් සහය අභිරක්ෂක, ප්‍රමෝදා වීරසේකර සඳහන්කළා ය. මෙම වැඩමුළුවල අධ්‍යාපනික පැතිකඩ

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

විස්තරකරමින් වීරසේකර පැවසුයේ "සහභාගීවන්නන් මෙම ඉගෙනුම් අත්දැකීම්වල නියැලෙන්නෙ කෞතුකාගාරයේ හා ප්‍රදර්ශනයේ සන්දර්භය තුළයි.ඔවුන් පිටව යන්නේ වැඩමුළුවෙන් ලබාගත් දැනුම පමණක් නොව ශ්‍රී ලාංකේය නූතන හා සමකාලීන කලාව පිළිබඳ නවීකෘත රුචිකත්වයක් ද සමගින්" යනුවෙනි.

'මුණගැසීම්හි' සෑම වටමාරුවක් ආරම්භයේදී ම, MMCA ශ්‍රී ලංකා එහි ප්‍රචාරක වැඩසටහන් හරහා කෞතුකාගාරය හා සම්බන්ධ අධ්‍යාපනඥයින් සඳහා පූර්ව-දර්ශන පැවැත්වීය. මෙය MMCA ශ්‍රී ලංකාහී අධ්‍යාපනික ප්‍රයත්න දිරිගන්වමින් EUහි සහයෝගය සක්‍රීයකළ තවත් මුලපිරීමකි. 'මුණගැසීම්හි' පළමු හා දෙවන වටරවුම් ආරම්භයේදී එවන් වැඩසටහන් ද්විත්වයක් 2022 පෙබරවාරි 10 සහ ජූනි 22 යන දිනවලදී ගුරුවරුන් 34 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්විණි. "අධ්‍යාපනය මූලිකකරගත් කෞතුකාගාරයක් ලෙස, අපගේ ප්‍රේක්ෂකයන්ට ඉගෙනුම් අත්දැකීම් ලබාදීම අපගේ ප්‍රමුඛතාවක්" යැයි ප්‍රකාශ කළ වීරසේකර, "'මුණගැසීම්' හා සම්බන්ධ මහජන වැඩසටහන් වෙත යුරෝපා සංගමය අඛණ්ඩව දැක්වූ සහයෝගය පිළිබඳව අප බෙහෙවින් ම කෘතඥවනවා" යැයි තවදුරටත් සඳහන් කළා ය.

MMCA ශ්‍රී ලංකා, කලාකරුවන්, ගෘහ නිර්මාණ ශිල්පීන්, සහ නිර්මාණකරුවන් ඇතුළු විවිධ පරාසයක පුද්ගලයන්ට සිය මහජන වැඩසටහන් පැවැත්වීම සඳහා ආරාධනාකරයි. EU ප්‍රදානය මගින් විවිධ වැඩමුළු, ගැලරි කතා, සහ අනෙකුත් මහජන වැඩසටහන් සඳහා එවැනි සම්පත්දායකයන් 103 සමග කටයුතුකිරීමට සහ ඔවුන්ට සහයෝගය දැක්වීමට හැකි විය. මීට අමතරව, කෞතුකාගාරයට බාහිර අධ්‍යාපනඥයින් (VE) 25 දෙනෙකු බඳවා ගැනීමට මෙම ප්‍රදානය සහයවිය. නරඹන්නන් සහ, ප්‍රදර්ශන සහ වැඩසටහන් අතර සම්බන්ධවීමේ පළමු පියවරයන් ලෙස සියළු මට්ටම්වල ප්‍රේක්ෂකයන් හා සම්බන්ධවීමට බාහිර අධ්‍යාපනඥයින් MMCA ශ්‍රී ලංකාහී ගැලරිවල සිටිති.

මෙම හවුල්කාරිත්වය පිළිබඳ අදහස් දක්වමින් ශ්‍රී ලංකා සහ මාලදිවයින් දේශපාලන, වෙළඳ, සහ ආර්ථික සබඳතා පිළිබඳ ජාත්‍යන්තර සම්බන්ධතා නිළධාරිණී ඈන් වෝජියර්-චැටර්ජි පැවසුවේ "MMCA ශ්‍රී ලංකාහී නව ප්‍රයත්නයට සහ එහි ප්‍රධාන අභිරක්ෂක ශාර්මිණී පෙරේයිරාට සහයෝගය ලබාදීම EU නියෝජිත පිරිසට සතුටක්. තව ද, අතීත සුරක්ෂිතාගාර මෙන් ම කෞතුකාගාර ද සජීවී අත්දැකීමක් වියයුතු අතර, එය 'මුණගැසීම්' ප්‍රදර්ශනය සමග ඉතා සාර්ථකව සාක්ශාත්වුණා." ප්‍රදර්ශනයේ සමාජ-දේශපාලනික වැදගත්කම වෙත අවධානය යොමුකරමින් වෝජියර්-චැටර්ජි සඳහන්කළේ, "'මුණගැසීම්' රටේ නූතන හා සමකාලීන කාලවට නව කවුළුවක් විවරකරන අතර ම වැදගත් සමාජ-දේශපාලනික වර්ධනයන් පිළිබිඹුකරනවා" සහ "එය අඛණ්ඩව, පන්ති සහ වයස් කාණ්ඩ හරහා ඉතා විවිධාකාරවූ තරුණ හා මහළු ප්‍රේක්ෂක පිරිසක් ආකර්ෂණය කරගනු ඇතැයි අප විශ්වාසකරනවා" යනුවෙනි.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය පිළිබඳ වැඩි විස්තර සඳහා, www.mmca-srilanka.org වෙත පිවිසෙන්න නැතිනම් facebook.com/mmcasrilanka පිටුව හෝ ඉන්ස්ටාග්‍රෑමයට instagram.com/mmcasrilanka/ පිවිසෙන්න.